Standard Chartered

## ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව පීඑල්සී

ඇ.ඩො. මිලියන

| වත්කම් | වත්කම් සාධාරණ අගයට | | | | වත්කම් ක්‍රමක්ෂය කළ පිරිවැය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | වෙළෙඳාම පිණිස | ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ රඳවාගැනීම්, ඉදිරි සුරැකුම් සඳහා | ලාභ හෝ අලාභ සාධාරණ අගයට නම් කළ | විකිණීම සඳහා වන | ණය සහ ලැබිය යුතු | කල් පිරීම තෙක් රඳවා තබන ලද | මූල්‍ය නොවන වත්කම් | එකතුව |
| මහ බැංකුවේ මුදල් ශේෂයන් | - | - | - | - | 70,706 | - | - | 70,706 |
| **මූල්‍ය වත්කම් රඳවා ගැනීම්, ලාභ හෝ අලාභ සාධාරණ අගයට නම්කළ** | | | | | | | | |
| ණය සහ අත්තිකාරම් බැංකු | 267 | - | 1,793 | - | - | - | - | 2,060 |
| ණය සහ අත්තිකාරම් ගනුදෙනුකරුවන්ට | 936 | - | 2,241 | - | - | - | - | 3,177 |
| භාණ්ඩාගාර බිල්පත් සහ අනෙකුත් මූල්‍ය උපකරණ | 12,025 | - | 354 | - | - | - | - | 12,379 |
| ණය සුරැකුම් පත් | 425 | - | 751 | - | - | - | - | 1,176 |
| හිමිකරු කොටස් | 1,285 | - | - | - | - | - | - | 1,285 |
| | 14,938 | - | 5,139 | - | - | - | - | 20,077 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 64,433 | 1,076 | | | | | | 65,509 |
| ණය සහ අත්තිකාරම් බැංකු | - | - | - | - | 72,609 | - | - | 72,609 |
| ණය සහ අත්තිකාරම් ගනුදෙනුකරුවන්ට | - | - | - | - | 252,719 | - | - | 252,719 |
| **සුරැකුම්පත් ආයෝජනය** | | | | | | | | |
| භාණ්ඩාගාර බිල්පත් සහ අනෙකුත් මූල්‍ය උපකරණ | - | - | - | 69,204 | 3,106 | 170 | - | 72,480 |
| ණය සුරැකුම් පත් | - | - | - | 1,388 | - | - | - | 1,388 |
| හිමිකරු කොටස් | - | - | - | 35,104 | - | - | - | 35,104 |
| | - | - | - | 105,696 | 3,106 | 170 | - | 108,972 |
| අනෙකුත් වත්කම් | - | - | - | - | 33,942 | - | 2,998 | 36,940 |
| විකිණීම සඳහා ඇති වත්කම් | - | - | - | - | 1,102 | - | 152 | 1,254 |
| **2016 දෙසැම්බර් 31 දිනට එකතුව (විගණනය කළ)** | **79,371** | **1,076** | **5,139** | **105,696** | **434,184** | **170** | **3,150** | **628,786** |
| මහ බැංකුවේ මුදල් ශේෂයන් | - | - | - | - | 65,312 | - | - | 65,312 |
| **මූල්‍ය වත්කම් රඳවා ගැනීම්, ලාභ හෝ අලාභ සාධාරණ අගයට නම්කළ** | | | | | | | | |
| ණය සහ අත්තිකාරම් බැංකු | 92 | - | 2,183 | - | - | - | - | 2,275 |
| ණය සහ අත්තිකාරම් ගනුදෙනුකරුවන්ට | 3,008 | - | 1,039 | - | - | - | - | 4,047 |
| භාණ්ඩාගාර බිල්පත් සහ අනෙකුත් මූල්‍ය උපකරණ | 12,896 | - | 389 | - | - | - | - | 13,285 |
| ණය සුරැකුම් පත් | 2,237 | - | 698 | - | - | - | - | 2,935 |
| හිමිකරු කොටස් | 859 | - | - | - | - | - | - | 859 |
| | 19,092 | - | 4,309 | - | - | - | - | 23,401 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 61,812 | 1,331 | | | | | | 63,143 |
| ණය සහ අත්තිකාරම් බැංකු | - | - | - | - | 64,494 | - | - | 64,494 |
| ණය සහ අත්තිකාරම් ගනුදෙනුකරුවන්ට | - | - | - | - | 257,356 | - | - | 257,356 |
| **සුරැකුම්පත් ආයෝජනය** | | | | | | | | |
| භාණ්ඩාගාර බිල්පත් සහ අනෙකුත් මූල්‍ය උපකරණ | - | - | - | 77,684 | 2,700 | 210 | - | 80,594 |
| ණය සුරැකුම් පත් | - | - | - | 1,720 | - | - | - | 1,720 |
| හිමිකරු කොටස් | - | - | - | 32,453 | - | - | - | 32,453 |
| | - | - | - | 111,857 | 2,700 | 210 | - | 114,767 |
| අනෙකුත් වත්කම් | - | - | - | - | 32,408 | - | 1,844 | 34,252 |
| විකිණීම සඳහා ඇති වත්කම් | - | - | - | - | - | - | 349 | 349 |
| **2015 දෙසැම්බර් 31 දිනට එකතුව (විගණනය කළ)** | **80,904** | **1,331** | **4,309** | **111,857** | **422,270** | **210** | **2,193** | **623,074** |

ඇ.ඩො.මිලියන

| වගකීම් | වගකීම් සාධාරණ අගයට | | | | | |
|---|---|---|---|---|---|---|
| | වෙළෙඳාම පිණිස | ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ රඳවාගැනීම්, ඉදිරි සුරැකුම් සඳහා | ලාභ හෝ අලාභ සාධාරණ අගයට නම් කළ | ක්‍රමක්ෂය කළ පිරිවැයට | මූල්‍ය නොවන වත්කම් | එකතුව |
| **ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය උපකරණ** | | | | | | |
| බැංකුවලට ගෙවිය යුතු | - | - | 718 | - | - | 718 |
| ගනුදෙනුකරුවන්ගේ ගිණුම් | - | - | 6,447 | - | - | 6,447 |
| නිකුත් කළ ණය සුරැකුම්පත් | - | - | 5,670 | - | - | 5,670 |
| විනිමය හර තත්ත්වයන් | 3,763 | - | - | - | - | 3,763 |
| | 3,763 | - | 12,835 | - | - | 16,598 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 62,917 | 2,795 | - | - | - | 65,712 |
| බැංකු මගින් ඇති තැන්පතු | - | - | - | 36,894 | - | 36,894 |
| ගනුදෙනුකරුවන්ගේ ගිණුම් | - | - | - | 371,855 | - | 371,855 |
| නිකුත් කළ ණය සුරැකුම්පත් | - | - | - | 46,700 | - | 46,700 |
| අනෙකුත් වගකීම් | - | - | - | 32,958 | 188 | 33,146 |
| යටත්කාලීන වගකීම් සහ අනෙකුත් ණය ගැනීම් | - | - | - | 19,523 | - | 19,523 |
| විකිණීම සඳහා වූ වගකීම් ඇතුළත්ව | | | | 958 | 7 | 965 |
| **2016 දෙසැම්බර් 31 දිනට එකතුව (විගණනය කළ)** | **66,680** | **2,795** | **12,835** | **508,888** | **195** | **591,393** |
| **ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය වගකීම්** | | | | | | |
| බැංකුවලට ගෙවිය යුතු | - | - | 637 | - | - | 637 |
| ගනුදෙනුකරුවන්ගේ ගිණුම් | - | - | 8,494 | - | - | 8,494 |
| නිකුත් කළ ණය සුරැකුම්පත් | - | - | 8,917 | - | - | 8,917 |
| විනිමය හර තත්ත්වයන් | 2,824 | - | - | - | - | 2,824 |
| | 2,824 | - | 18,048 | - | - | 20,872 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 59,390 | 2,549 | - | - | - | 61,939 |
| බැංකු මගින් ඇති තැන්පතු | - | - | - | 37,611 | - | 37,611 |
| ගනුදෙනුකරුවන්ගේ ගිණුම් | - | - | - | 350,633 | - | 350,633 |
| නිකුත් කළ ණය සුරැකුම්පත් | - | - | - | 59,880 | - | 59,880 |
| අනෙකුත් වගකීම් | - | - | - | 31,525 | 414 | 31,939 |
| යටත්කාලීන වගකීම් සහ අනෙකුත් ණය ගැනීම් | - | - | - | 21,852 | - | 21,852 |
| විකිණීම සඳහා වූ වගකීම් ඇතුළත්ව | - | - | - | - | 72 | 72 |
| **2015 දෙසැම්බර් 31 දිනට එකතුව (විගණනය කළ)** | **62,214** | **2,549** | **18,048** | **501,501** | **486** | **584,798** |

## ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව, ශ්‍රී ලංකාව

රුපියල් දහස් වලින්

| අනෙකුත් ගනුදෙනුකරුවන් සඳහා වූ ණය සහ ලැබිය යුතු දෑ | 2016/12/31 දිනට වර්තමාන කාලච්ඡේදය (විගණනය කළ) | 2015/12/31 දිනට පෙර කාලච්ඡේදය (විගණනය කළ) |
|---|---|---|
| දළ ණය සහ ලැබිය යුතු දෑ | 68,429,314 | 52,993,830 |
| (අඩු කළා): කේවල හානිකරණය | (525,688 ) | (17,884) |
| සමූහ හානිකරණය | (308,645 ) | (308,634) |
| **ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ ණය සහ ලැබිය යුතු දෑ ඇතුළත්ව** | **67,594,981** | **52,667,312** |
| **(අඩු කළා): ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ ණය සහ ලැබිය යුතු දෑ** | **-** | **-** |
| **ශුද්ධ ණය සහ ලැබිය යුතු දෑ** | **67,594,981** | **52,667,312** |

| ණය සහ ලැබිය යුතු දෑ - අනෙකුත් ගනුදෙනුකරුවන් - වර්ගය අනුව | 2016/12/31 දිනට වර්තමාන කාලච්ඡේදය (විගණනය කළ) | 2015/12/31 දිනට පෙර කාලච්ඡේදය (විගණනය කළ) |
|---|---|---|
| **වර්ගය අනුව - දේශීය මුදල්** | | |
| බැංකු අයිරා | 13,169,349 | 6,491,389 |
| කාලීන ණය | 14,780,922 | 11,954,543 |
| ලැබිය යුතු කල්බදු වාරික | - | - |
| ණය කාඩ්පත් | 5,582,137 | 5,055,606 |
| උකස් ණය | - | - |
| වෙනත් ණය | 13,397,579 | 11,924,282 |
| **උප එකතුව** | **46,929,987** | **35,425,820** |
| වර්ගය අනුව - විදේශීය මුදල් | | |
| බැංකු අයිරා | 1,064,761 | 1,831,737 |
| කාලීන ණය | 8,636,740 | 7,417,594 |
| වෙනත් ණය | 11,797,826 | 8,318,679 |
| **උප එකතුව** | **21,499,327** | **17,568,010** |
| **එකතුව** | **68,429,314** | **52,993,830** |

| අනෙකුත් ගනුදෙනුකරුවන්ට දී ඇති ණය සහ ලැබිය යුතු දෑ සඳහා කේවල සහ සමූහ හානිකරණයේ කාලච්ඡේදය තුළ වෙනස්වීම් | 2016/12/31 දිනට වර්තමාන කාලච්ඡේදය (විගණනය කළ) | 2015/12/31 දිනට පෙර කාලච්ඡේදය (විගණනය කළ) |
|---|---|---|
| කේවල හානිකරණය | | |
| ආරම්භක ශේෂය | 17,884 | 21,430 |
| ආදායම් ප්‍රකාශයට අයකිරීම්/(ආපසු ලියාහැරීම්) | 612,053 | 128,940 |
| කාලච්ඡේදය තුළ කපාහැරීම් | (104,249 ) | (132,006) |
| වෙනත් වෙනස්වීම් | - | (480) |
| **අවසාන ශේෂය** | **525,688** | **17,884** |
| සමූහ හානිකරණය | | |
| ආරම්භක ශේෂය | 308,634 | 345,152 |
| ආදායම් ප්‍රකාශයට අයකිරීම්/(ආපසු ලියාහැරීම්) | (796 ) | (45,796) |
| වෙනත් වෙනස්වීම් | 807 | 9,278 |
| **අවසාන ශේෂය** | **308,645** | **308,634** |
| **මුළු හානිකරණය** | **834,333** | **326,518** |

| අනෙකුත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු දෑ - වර්ගය අනුව | 2016/12/31 දිනට වර්තමාන කාලච්ඡේදය (විගණනය කළ) | 2015/12/31 දිනට පෙර කාලච්ඡේදය (විගණනය කළ) |
|---|---|---|
| **වර්ගය අනුව - දේශීය මුදල්** | | |
| ඉල්ලුම් තැන්පතු (ජංගම ගිණුම්) | 12,646,723 | 12,646,515 |
| ඉතුරුම් තැන්පතු | 20,088,395 | 14,017,441 |
| ස්ථාවර තැන්පතු | 19,846,507 | 16,157,558 |
| වෙනත් තැන්පතු | 2,526,747 | 2,726,189 |
| **උප එකතුව** | **55,108,372** | **45,547,703** |
| වර්ගය අනුව - විදේශීය මුදල් | | |
| ඉල්ලුම් තැන්පතු (ජංගම ගිණුම්) | 18,090,491 | 9,758,885 |
| ඉතුරුම් තැන්පතු | 29,608,761 | 12,764,070 |
| ස්ථාවර තැන්පතු | 2,795,974 | 2,497,217 |
| වෙනත් තැන්පතු | 5,377,579 | 8,400,576 |
| **උප එකතුව** | **55,872,805** | **33,420,748** |
| **එකතුව** | **110,981,177** | **78,968,451** |

## ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව, ශ්‍රී ලංකාව

රුපියල් දහස් වලින්

### ඇගයීම් මත මූල්‍ය මෙවලම් විශ්ලේෂණය කිරීම

| 2016/12/31 දිනට (විගණනය කළ) | වෙළෙඳාම පිණිස ඇති | සාධාරණ අගයට නම් කළ | කල්පිරීම තෙක් රඳවාගත් | ක්‍රමක්ෂය වටිනාකම | විකිණීම සඳහා ඇති | ඉදිරි රැකුම් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | | | |
| මුදල්, මුදල් හා සමාන දෑ | - | - | - | 6,886,081 | - | - | 6,886,081 |
| ශ්‍රී ලංකා මහ බැංකුව වෙතැති ශේෂයන් | - | - | - | 3,651,548 | - | - | 3,651,548 |
| බැංකු තුළ ස්ථාපනය කිරීම | - | - | - | 24,256,873 | - | - | 24,256,873 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 749,113 | - | - | - | - | - | 749,113 |
| අලෙවිය සඳහා යොදවන ලද වෙනත් මූල්‍ය වත්කම් | - | - | - | - | - | - | - |
| බැංකුවට ලැබිය යුතු දෑ හා ණය | - | - | - | 8,768,830 | - | - | 8,768,830 |
| අනෙකුත් ගනුදෙනුකරුවන්ට ලැබිය යුතු දෑ හා ණය | - | - | - | 67,594,980 | - | - | 67,594,980 |
| මූල්‍ය ආයෝජන | 4,775,801 | - | - | - | 24,159,083 | - | 28,934,884 |
| **මුළු මූල්‍ය වත්කම්** | **5,524,914** | **-** | **-** | **111,158,312** | **24,159,083** | **-** | **140,842,309** |

| 2016/12/31 දිනට (විගණනය කළ) | වෙළෙඳාම පිණිස ඇති | සාධාරණ අගයට නම් කළ | ක්‍රමක්ෂය වටිනාකම | ඉදිරි රැකුම් | එකතුව |
|---|---|---|---|---|---|
| **වගකීම්** | | | | | |
| බැංකුවලට ගෙවිය යුතු | - | - | 1,975,053 | - | 1,975,053 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 733,609 | - | - | - | 733,609 |
| ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ වෙනත් මූල්‍ය වගකීම් | - | - | - | - | - |
| ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු | - | - | 110,981,177 | - | 110,981,177 |
| වෙනත් ණය ගැණීම් | - | - | 112,330 | - | 112,330 |
| වෙනත් ගැනීම් | - | - | - | - | - |
| **මුළු මූල්‍ය වගකීම්** | **733,609** | **-** | **113,068,560** | **-** | **113,802,169** |

| 2015/12/31 දිනට (විගණනය කළ) | වෙළෙඳාම පිණිස ඇති | සාධාරණ අගයට නම් කළ | කල්පිරීම තෙක් රඳවාගත් | ක්‍රමක්ෂය වටිනාකම | විකිණීම සඳහා ඇති | ඉදිරි රැකුම් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | | | |
| මුදල්, මුදල් හා සමාන දෑ | - | - | - | 4,438,210 | - | - | 4,438,210 |
| ශ්‍රී ලංකා මහ බැංකුව වෙතැති ශේෂයන් | - | - | - | 2,997,535 | - | - | 2,997,535 |
| බැංකු තුළ ස්ථාපනය කිරීම | - | - | - | 9,225,543 | - | - | 9,225,543 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 1,163,537 | - | - | - | - | - | 1,163,537 |
| ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ වෙනත් මූල්‍ය වත්කම් | - | - | - | - | - | - | - |
| බැංකුවට ලැබිය යුතු දෑ හා ණය | - | - | - | 5,074,856 | - | - | 5,074,856 |
| ගනුදෙනුකරුවන්ට ලැබිය යුතු දෑ හා ණය | - | - | - | 52,667,312 | - | - | 52,667,312 |
| මූල්‍ය ආයෝජන | 3,418,139 | - | - | - | 29,801,689 | - | 33,219,828 |
| **මුළු මූල්‍ය වත්කම්** | **4,581,676** | **-** | **-** | **74,403,456** | **29,801,689** | **-** | **108,786,821** |

| 2015/12/31 දිනට (විගණනය කළ) | වෙළෙඳාම පිණිස ඇති | සාධාරණ අගයට නම් කළ | ක්‍රමක්ෂය වටිනාකම | ඉදිරි රැකුම් | එකතුව |
|---|---|---|---|---|---|
| **වගකීම්** | | | | | |
| බැංකුවලට ගෙවිය යුතු | - | - | 2,823,920 | - | 2,823,920 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 851,015 | - | - | - | 851,015 |
| ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ වෙනත් මූල්‍ය වගකීම් | - | - | - | - | - |
| ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු | - | - | 78,968,451 | - | 78,968,451 |
| වෙනත් ණය ගැණීම් | - | - | 362,520 | - | 362,520 |
| වෙනත් ගැනීම් | - | - | - | - | - |
| **මුළු මූල්‍ය වගකීම්** | **851,015** | **-** | **82,154,891** | **-** | **83,005,906** |

## ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් සමූහය

ඇ.ඩො. මිලියන

| ගනුදෙනුකරුවන් සඳහා ණය සහ අත්තිකාරම් | 2016/12/31 දිනට වර්තමාන කාලච්ඡේදය (විගණනය කළ) | 2015/12/31 දිනට පෙර කාලච්ඡේදය (විගණනය කළ) |
|---|---|---|
| ගනුදෙනුකරුවන් සඳහා ණය සහ අත්තිකාරම් | 262,250 | 268,083 |
| කේවල හානිකරණය | (5,667) | (6,023 ) |
| සමූහ හානිකරණය | (687) | (657 ) |
| | **255,896** | **261,403** |
| ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ ණය සහ ලැබිය යුතු දෑ ඇතුළත්ව | (3,177) | (4,047 ) |
| **ශුද්ධ ණය සහ ලැබිය යුතු දෑ** | **252,719** | **257,356** |

| වෙනත් ගනුදෙනුකරුවන් සහ බැංකු සඳහා ගෙවිය යුතු - වර්ගය අනුව | 2016/12/31 දිනට වර්තමාන කාලච්ඡේදය (විගණනය කළ) | 2015/12/31 දිනට පෙර කාලච්ඡේදය (විගණනය කළ) |
|---|---|---|
| ගනුදෙනුකාර ගිණුම් | 371,855 | 350,633 |
| ගනුදෙනුකාර ගිණුම්, ලාභ හා අලාභ මත සාධාරණ අගය සඳහා වන මූල්‍ය වගකීම් | 6,447 | 8,494 |
| **එකතුව** | **378,302** | **359,127** |

## සහතික කිරීම

ඉහත දක්වා ඇති සාරාංශගත මූල්‍ය තොරතුරු බැංකුවෙහි 2016 දෙසැම්බර් 31 දිනට අදාළ විගණනය කරන ලද මූල්‍ය වාර්තාවලින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව (SLFRS/LKAS) පිළියෙළ කොට ඇත.

සංසන්දනය කිරීම පහසුකිරීම පිණිස, පෙර කාලච්ඡේදයට අදාළ අගයන් නැවත ගණනය කොට මෙම වර්ෂයේ ඉදිරිපත්කිරීම් සමග සැසඳීමට පහසුකම් සලසා ඇත. පහත අත්සන් කර ඇති ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී සහ මූල්‍ය පාලක වන අප එක්ව සහතික කරන්නෙමු. ඉහත ප්‍රකාශන පිළියෙළ කොට ඇත්තේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිර්දේශ කළ ආකෘතියට සහ නිර්වචනයන්ට අනුකූලව බවත්, (a) දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් ගොනුකරන ලද හරබදු සඳහා වූ එකතුකිරීම් සහ ගෙවීම් පිළිබඳ නඩු විධානයන් මෙන්ම බැංකුව විසින් ඊට එරෙහිව කරන ලද කරුණු ඉදිරිපත්කිරීම් ද (b) ශ්‍රී ලංකා රජය විසින් අත්පත් කරගනු ලැබූ බැංකුව සතු වූ ගොඩනැගිල්ලට අදාළ කරුණු ද සැලකිල්ලට ගනිමින්, මෙහි සඳහන් අදාළ ගිණුම්, විගණකවරුන් වන KPMG විසින් තත්ත්වාගණනය නොකළ විගණන මතයක් 2017 මාර්තු 28 දින නිකුත් කරන ලදී.

| | |
|---|---|
| **ජිම් මැකාබේ** | **නිශානි ආරියවංශ** |
| (අත්සන් කළේ) ප්‍රධාන විධායක නිලධාරී | (අත්සන් කළේ) මූල්‍ය පාලක |
| 2017 මාර්තු 28 | 2017 මාර්තු 28 |

Standard Chartered

# ආයතනික පාලන ප්‍රකාශය

ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් බැංකුව යනු ප්‍රමුඛ පෙළේ ජාත්‍යන්තර බැංකුකරණ සමූහයකි. වසර 150 ක පමණ ඉතිහාසයක් සහිත එය ලොව ඉතාමත් සක්‍රීය වෙළඳපොළවල් රැසක සිය ව්‍යාපාරික මෙහෙයුම් ක්‍රියාත්මක කරන අතර ආසියාව, අප්‍රිකාව සහ මැද පෙරදිග වැනි කලාපවල ජනතාවට සහ සමාගම් හා ආයතනවලට බැංකුකරණ සේවා සපයා දෙමින් එම කලාපවල ආයෝජන කටයුතු වෙළඳාම් සහ ධන උත්පාදනය වර්ධනය කරයි. එහි ප්‍රධාන කාර්යාලය ලන්ඩනයේ පිහිටා තිබේ. ලන්ඩන් සහ හොංකොං කොටස් හුවමාරුවල ද්විත්ව මූලික ලැයිස්තුගතවීම් හිමි එය, වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය අනුව FTSE 100 හි ලැයිස්තුගත වූ සමාගම් අතරට ඇතුළත් වී ඇත. ඉතිහාසය පුරාම, වෙළඳ මූල්‍ය සේවා සහ වාණිජ බැංකුකරණය මත පදනම් වී පැවතීම ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් හි සාර්ථකත්වයට ප්‍රධානතම හේතුවක් වී තිබේ. බැංකුවේ සන්නාම ප්‍රතිඥාව වන ‘Here for Good’ යන්න එහි සෑම තීරණයකින්ම නිරූපණය වන අතර සිය සේවාදායකයන්, හවුල්කරුවන් සහ තමන් මෙහෙයුම් කරන රටවල් ආදී සියල්ල කෙරෙහි බැංකුව දක්වන කැපවීමට එය මූලික පදනම සපයයි.

## ආයතන පාලනය කෙරෙහි අපගේ සර්වග්‍රාහී ප්‍රවේශය

කාර්යක්ෂම ආයතනික පාලනයක් පවත්වාගත හැක්කේ විනිවිදභාවය අගයන සංස්කෘතියක් පවත්වාගැනීමෙන් සහ කළමනාකාරීත්වය, අධ්‍යක්ෂ මණ්ඩලය සහ සමස්ත සමූහ ව්‍යාපාරය ආවරණය වන පරිදි විවෘතභාවය පවත්වා ගැනීමෙන් ය යන්න ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් සමාගමේ විශ්වාසය වේ.

ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් හි පවතින්නේ අනුබද්ධ සමාගම් හා ශාඛා හරහා ක්‍රියාත්මක වන, සමූහ ව්‍යාපාර ව්‍යුහයකි. එය අදාළ රටවල හා ප්‍රදේශවල නෛතික, නියාමන හා පාලන අවශ්‍යතාවලට ගරුකරන අතර සමස්ත පාලනය සඳහා ස්ථාවර ප්‍රවේශයක් පවත්වාගනී. මෙම ප්‍රකාශනයට අදාළ වර්ෂය තුළදී සමාගමේ භූගෝලීය කලාප 4 තුළ පාලන කටයුතු කළමනාකරණය කරන ලද්දේ අදාළ කලාපවල ප්‍රධාන විධායක නිලධාරී කාර්යාල, ව්‍යාපාරය සහ ක්‍රියාකාරීත්වය මගිනි. සේවාදායකයන්ට අමතරව, මෙම පාර්ශ්වකරුවන් අතරට බැංකුව මෙහෙයුම් ක්‍රියාත්මක කරන රටවල රජයන්, නියාමකවරුන්, කොටස් හිමිකරුවන්, කාර්ය මණ්ඩලය, සැපයුම්කරුවන් සහ අදාළ රටවල ප්‍රජාවන් ඇතුළත් වේ.

ප්‍රමුඛ පෙළේ ජාත්‍යන්තර බැංකුවක් ලෙස, සිය සමස්ත මෙහෙයුම් ආවරණය වන පරිදි ආයතනික පාලනය සම්බන්ධයෙන් විශිෂ්ටතම පරිචයන් පවත්වාගැනීමට බැංකුව සෑම විටම උත්සහ ගනී. සමාගමක කාර්යක්ෂම ආයතනික පාලනයක් ස්ථාපිත වීමට නම් ඊට අදාළ සාරධර්ම හා වටිනාකම් සහිත සංස්කෘතියක් සමාගම තුළ පැවතිය යුතු බව බැංකුවේ විශ්වාසය වේ. ආයතනික පාලන රාමුව තුළ පවතින සම්මතයන්ට නෛතිකව මෙන්ම සද් චේතනාවෙන් යුතුව අනුකූල වීම හා ඒවා පිළිපැදීම සියලුම සේවක සේවිකාවන්ගේ වගකීමකි.

බැංකුවේ සන්නාම පොරොන්දුව වන ‘Here for Good’ යන්න ප්‍රායෝගිකව පිළිපැදීම සෑම සේවකයෙකු/සේවිකාවකගෙන්ම අපේක්ෂා කෙරේ. එමෙන්ම අභියෝගවලට සූදානම්, එහෙත් සහයෝගීත්වය පෙරදැරිව වැඩකරන සංස්කෘතියක කොටස්කරුවන් වීමට ඔවුන් කටයුතු කළ යුතු ය.

## ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් සමූහයේ අධ්‍යක්ෂ මණ්ඩලය

ව්‍යාපාරික ක්‍රියාකාරීත්ව අංශවල පිටුබලය සහිත ගෝලීය හා කලාපීය සේවාදායක කාණ්ඩවලින් ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් පීඑල්සී සමන්විත වේ. සභාපති හොසේ විඥාල්ස් මහතා අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධානියා ලෙස කටයුතු කරයි. කළමනාකාරීත්ව කණ්ඩායමේ නායකයා ලෙස කටයුතු කරනුයේ සමූහ ප්‍රධාන විධායක නිලධාරී බිල් වින්ටර්ස් මහතා වන අතර සමූහයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී ඇන්ඩි හැල්ෆර්ඩ් මහතාගේ සහයද ඔහුට හිමි වේ. සභාපතිතුමන්ට අතිරේක සහයක් ලබාදෙමින් සහ සමූහය නියෝජනය කරමින් නගීබ් කෙරාජ් මහතා 2016 දෙසැම්බර් පළමු වෙනිදා සිට නියෝජ්‍ය සභාපති ලෙස කටයුතු කරයි.

විවිධ අංශවල පැතිරුණු දැනුම හා අත්දැකීම්වලින් අනූන අධ්‍යක්ෂවරුන් පිරිසකගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ. 2016 දෙසැම්බර් මස අවසානය වනවිට, මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් නව දෙනෙකු ආසියා, අප්‍රිකා හෝ මැද පෙරදිග කලාපවල ජීවත් වී හෝ රැකියාවේ නියුතු වී සිට තිබූ අතර ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් අඩකට වැඩි ප්‍රමාණයකට බැංකුකරණ, මූල්‍ය, අවදානම් හා ගිණුම් වැනි අංශ සම්බන්ධයෙන් අත්දැකීම් තිබිණි.

විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ සේවා කාලය මනාව සමබරව පවතින බව තහවුරු කරගැනීමට අපි නිරතුරුව කටයුතු කරන්නෙමු.

## විවිධත්වය හා අන්තර්ග්‍රහණය

සුවිශේෂී ආවරණ පරාසයක් සහිත ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය ඉතිහාසය පුරාම මනා විවිධත්වයෙන් යුක්තව පැවතී තිබේ. දැනුම, කුසලතා, අත්දැකීම් හා සංස්කෘතික වෙනස්කම් යනාදියේ මනා සම්මිශ්‍රණයක් වන එහි විවිධත්වය එම මණ්ඩලයේ සාර්ථකත්වයට බෙහෙවින් බලපා ඇත. 2017 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ කාන්තා සාමාජිකත්ව ප්‍රතිශතය 25% දක්වා ඉහළ නංවමින් ඉදිරියේදී කාන්තා දායකත්වය තවදුරටත් පුළුල් කිරීම සඳහා මේ වනවිට සැලසුම් සකස් කර අවසන් ය. වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල විවිධත්ව ප්‍රතිපත්ති ප්‍රකාශනය හඳුන්වා දීමත් සමග මෙම ප්‍රතිඥාව වඩාත් තහවුරු වී තිබේ. ඉදිරියේදී අධ්‍යක්ෂ මණ්ඩලය තුළ කාන්තා නියෝජනය 33% දක්වා ඉහළ නැංවීම සමාගමේ අපේක්ෂාව වී ඇත.

## ක්‍රමෝපායික ගැටලු සම්බන්ධ අවධානය

ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් සමූහ ව්‍යාපාරයට මෙන්ම සමස්තයක් ලෙස ගෝලීය බැංකු ක්ෂේත්‍රයට අනාගතයේදී මුහුණදීමට සිදුවන අභියෝග සම්බන්ධයෙන් යථාර්ථවාදී දැක්මක් ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් සතු ය. නීතිරීති ඒකාබද්ධ කරමින් පාලන වාතාවරණය වැඩිදියුණු කරන අතරම ආර්ථිකයන්ට වටිනාකම් එක්කරමින් කොටස් හිමිකරුවන්ට තිරසාර ප්‍රතිලාභ ලබාදීමට ප්‍රතිපත්ති සම්පාදකයන් උත්සහ දරමින් සිටින මෙවන් වකවානුවක රෙගුලාසිමය පසුබිම සම්බන්ධයෙන් නොයෙකුත් අවිනිශ්චිතතා පවතී. එමෙන්ම බැංකුව මෙහෙයුම් ක්‍රියාත්මක කරන ආර්ථිකයන්ගේ අනාගතයද දිගින් දිගටම අවිනිශ්චිත මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. බැංකුවේ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම සඳහා 2015 දී සකස් කරන ලද ව්‍යාපාරික සැලැස්ම, පවතින තත්ත්වයන්ට ගැළපෙන ලෙස සකස් කරන ලද සැලැස්මකි. පාරිභෝගික සේවාවන් වැඩිදියුණු කිරීම සහ පාලනය වඩාත් දැඩි කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණය වෙනුවෙන් ආයෝජනය කිරීම, ඉදිරියට යාමට ඇති හොඳම මග වේ.

මේ වනවිට ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් සමූහය සතුව වඩාත් ශක්තිමත් ප්‍රාග්ධන පදනමක් පවතින අතර එම නිසාම අභියෝගවලට මුහුණ දීමේ හැකියාව අප සතු ය. තම මූලික සැලසුම ක්‍රියාත්මක කරන අතරම අවශ්‍ය තැන්වලදී අදාළ තත්ත්වයන්ට අනුගත වීම බැංකුවේ අපේක්ෂාව වේ. මේ ආකාරයට සැලකිය යුතු මට්ටමකට සිය පදනම් ශක්තිමත් කරගැනීමෙන් අනතුරුව, වර්ධනය යළි වේගවත් කරමින් වඩාත් දැඩි වියදම් පාලන හා අවදානම් කළමනාකරණ ක්‍රමවේද ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම බැංකුව හඳුනාගෙන ඇති අතර, මේ මගින් කොටස් හිමියන්ට ලැබෙන ප්‍රතිලාභ වඩාත් පුළුල් සහ තිරසාර මට්ටමකට පැමිණෙනු ඇත.

සිය ව්‍යාපාරික හා ආයතනික බැංකුකරණයේ සේවාදායක ආවරණ ආදර්ශයේ සැලකිය යුතු වැඩිදියුණු කිරීම් සිදුකිරීමට බැංකුව කටයුතු කර ඇති අතර සිය පාරිභෝගික බැංකුකරණ සේවාවන් වඩාත් ඩිජිටල්කරණය වූ ආකෘතියක් වෙත පරිවර්තනය කරමින් සිටී. මෙම උත්සහයන් මගින් ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් සමග ගනුදෙනු කිරීම වඩාත් පහසු වනු ඇත. වඩාත් දීර්ඝකාලීන හා තිරසාර වර්ධනයක් අත්පත් කරගැනීම සහ වැඩි ආදායම් ඉපැයීම සඳහා බැංකුව සිය වාණිජ බැංකුකරණ සේවාවන් ප්‍රතිස්ථානගත කර තිබේ. නව ආයතනික ව්‍යුහය දැන් ස්ථාවර තත්ත්වයකට පැමිණ ඇත. බැංකුවේ ශක්තිමත් මධ්‍යම ශක්‍යතාවන්ගෙන් පන්නරය ලබමින් සමූහයේ නිෂ්පාදන හා සේවාවන් වඩාත් පහසුවෙන් ගනුදෙනුකරුවන් වෙත ලබාදීම සඳහා දේශීය කළමනකාරීත්වයට අවස්ථාව ලැබී තිබේ.

## මූල්‍ය වාර්තාකරණය

සමාගමේ මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ කමිටුවේ මූලික වගකීම වන්නේ සමාගමේ මූල්‍ය ප්‍රකාශන හෝ මූල්‍ය ක්‍රියාකාරීත්වය සම්බන්ධ ඕනෑම නිවේදනයක් සම්බන්ධ අවංකභාවය නිරීක්ෂණය කිරීම සහ ඒවායේ අඩංගු ඕනෑම ආකාරයක වැදගත් මූල්‍ය වාර්තාකරණ තීරණයක් විශ්ලේෂණයට ලක්කිරීමයි.

රට රටවල වාර්තාකරණ කණ්ඩායම් විසින් ලැබෙන තොරතුරු අදාළ අංශ වෙත ගොනු කිරීම, මූලික ඇස්තමේන්තු හා විනිශ්චයන් ඇතුළුව ගිණුම්කරණ ප්‍රතිපත්ති හා පරිචයන් ක්‍රියාත්මක කිරීම සහ සමූහයට අදාළ වන ප්‍රකාශිත මූල්‍ය ප්‍රකාශන හා නිල නිවේදන සම්බන්ධ ප්‍රමාණවත් ගිණුම්කරණ හා මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීම සමූහ මූල්‍ය අංශයේ කාර්යභාරය හා වගකීම වේ. අදාළ ගිණුම්කරණ මූලිකාංග, නීතිරීති හා රෙගුලාසිමය සීමාවන්ට අනුකූලව කටයුතු සිදුවන්නේද යන්න තහවුරු කරගැනීම සඳහා සමූහයේ මූල්‍ය කණ්ඩායම සහ අදාළ රටවල වාර්තාකරණ කණ්ඩායම් ඒකාබද්ධව විවිධ විශ්ලේෂණ විධිවිධාන ක්‍රියාවට නංවනු ලබයි. සැලකිය යුතු මට්ටමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති, මූල්‍ය වාර්තාකරණ විනිශ්චයන් සහ ඇස්තමේන්තුවල වෙනස්කම් ඇතුළුව මූල්‍ය වාර්තාකරණයන්ට අදාළ කටයුතු කළමනාකරණය කිරීම සහ විසඳුම් ලබාගැනීම සඳහා මෙම කණ්ඩායම් නිරතුරුව එක්ව කටයුතු කරති. රටක වාර්තාකරණ කණ්ඩායම් මගින් වාර්තා කරනු ලබන සියලුම මූල්‍ය තොරතුරු එම රටේ සිටින මූල්‍ය පාලකවරයාගේ තහවුරු කිරීමට යටත් වේ.

සැලකිය යුතු ගිණුම්කරණ ඇස්තමේන්තු සහ තීරණ ඇතුළුව සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා පරිචයන් යහපත් මට්ටමේ පවතින බවට කමිටුව තෘප්තිමත් ය. 2016 වසර තුළදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් කමිටුව විසින් ප්‍රථම සහ තුන්වෙනි කාර්තුවල අන්තර්වාර මූල්‍ය ප්‍රකාශන පරීක්ෂාවට ලක්කරන ලදී. 2016 වසර තුළදී ණය හා අත්තිකාරම් හානි, මූල්‍ය උපකරණ තක්සේරුකරණය සහ කීර්තිනාමයට හානි සිදුවීමේ පරීක්ෂණයන් සම්බන්ධයෙන් කමිටුව විශේෂ අවධානයක් යොමුකළේ ය.

## අවදානම් කළමනාකරණය

බැංකුවේ සියලුම පාර්ශ්වකරුවන් වෙනුවෙන් නොවෙනස් හා තිරසාර ක්‍රියාකාරීත්වයක් සහතික කිරීම සඳහා කාර්යක්ෂම ලෙස අවදානම් කළමනාකරණය සිදුකිරීම අවශ්‍ය වේ. එම නිසා එය සමූහයේ මූල්‍ය හා මෙහෙයුම් කළමනාකරණයේ අනිවාර්ය අංගයක් වී ඇත. සමූහය සිය ගනුදෙනුකරුවන් හරහා තමන් මෙහෙයුම් ක්‍රියාත්මක කරන ප්‍රදේශවල ප්‍රජාවන් වෙනුවෙන් වටිනාකම් එක්කරන අතර අවදානම් භාරගෙන කළමනාකරණය කිරීම මගින් ආදායම් උත්පාදනය කරයි. ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් අවදානම් කළමනාකරණ වැඩසටහන් රාමුව යටතේ බැංකුව සිය අවදානම් රුචිකත්වයේ සීමාවන් තුළ සිටිමින්, අවදානම් අනුව වෙනස් කරන ලද ආදායම වර්ධනය කිරීමේ අරමුණ පෙරදැරිව, සමස්ත ව්‍යාපාරික ක්ෂේත්‍රය ආවරණය වන පරිදි අවදානම් කළමනාකරණය කරයි.

අවදානම් සහ අනුකූලතා සම්බන්ධයෙන් ගත් කල 2016 වසර තුළ විවිධ අංශවලින් විශාල ප්‍රගතියක් වාර්තා කිරීමට බැංකුවට හැකියාව ලැබිණි. වඩාත් පුළුල් ශේෂ පත්‍රයක්, වැඩි ආවරණයක් සහිත අවදානම් රුචිකත්වයක් සහ සමාගමේ ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීමට උපකාරී වන අවදානම් පාලන ව්‍යුහයක් සමගින් වසර අවසන් විය.

සමෝධානික ලෙස අවදානම් හඳුනාගෙන, තක්සේරු කර කළමනාකරණය කිරීමත්, බාහිර වාතාවරණයේ කවර අවිනිශ්චිතතා පැවතියද අවදානම් හා අනුකූලතා අංශයන් මගින් සමූහයේ තිරසාර ක්‍රියාකාරීත්වයට දායකත්වය ලැබෙන බව තහවුරු කිරීමත් ඉතාමත් වැදගත් වේ.

අවදානම් හා අනුකූලතා අංශය සමාගමේ ක්‍රමෝපායික තීරණ ගැනීමේ ක්‍රියාවලියේ අනිවාර්ය අංගයක් වන අතර ඒ ඔස්සේ වඩාත් ඉහළ ප්‍රතිලාභ සහිත ශක්තිමත් සහ වඩාත් කාර්යක්ෂම ව්‍යාපාරයක් ගොඩනැංවීමේ හැකියාව එය සතු ය. සිය ක්‍රමෝපාය ක්‍රියාවට නැංවීම සඳහා සමූහය සතු ව්‍යාපාරික සැලසුම් එහි නිසි සීමාවන්ට යටත් අවදානම් රුචිකත්වය හා සමගාමී වන අතර මෙම අංශ දෙකම අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමින් නිරීක්ෂණයට ලක්වේ. ශක්තිමත් ප්‍රාග්ධන හා ද්‍රවශීලතා ආස්ථානයක් බැංකුව සතු වන අතර අත්දැකීම් බහුල, ප්‍රවීණයන් කණ්ඩායමක් විසින් මෙහෙයවනු ලබන දැඩි අවදානම් කළමනාකරණ ව්‍යුහයක්ද එහි ක්‍රියාත්මක කර ඇත.

යහපත් අවදානම් කළමනාකරණය යනු හුදෙක් අවදානම්වලට නිරාවරණය වීම අවම කිරීම නොවේ. සිය ආවරණ පරාසය තවතවත් පුළුල් කරමින් ඇතැම් ක්ෂේත්‍ර හා ස්ථානවලට අදාළව සිය නිරාවරණය තෝරා බේරාගෙන ඉහළ නැංවීමට බැංකුව කටයුතු කර තිබේ. සමෝධානික ලෙස අවදානම් හඳුනාගෙන ඒවා කළමනාකරණය කිරීම සඳහා පාලන ක්‍රියාකාරීත්වයන් ලෙස අවදානම් හා අනුකූලතා කටයුතු සාර්ථකව ක්‍රියාත්මක වන්නේද යන්න තහවුරු කරගැනීම කෙරෙහි මූලික අවධානය යොමුවී ඇත. සාර්ථක ලෙස ව්‍යාපාරික ඉලක්ක ළඟා කරගැනීමට සහ සුරක්ෂිතා හා තිරසාර වර්ධනයක් සාක්ෂාත් කරගැනීමට සියලු දෙනාගේ දායකත්වය ලබන යහපත් අවදානම් සම්ප්‍රදායක් පැවතීම ඉතාමත් වැදගත් ය.

## සන්නාමය හා වටිනාකම්

2015 වසර අවසාන වනවිට සමූහයේ සන්නාම පොරොන්දුව වන ‘Here for Good’ යන්න සම්බන්ධ විශ්ලේෂණයක් සිදුකෙරුණු අතර මීට එම පොරොන්දුව දියත් කිරීම, ක්‍රියාවට නැංවීම සහ එහි බලපෑම් ආදී අංශ රැසක් ඇතුළත් විය. මෙමගින් හඳුනා ගැනුණු එක් වැදගත් නිරීක්ෂණයක් වූයේ ‘Here for Good’ යන්න කාර්ය මණ්ඩලය හොඳින් වටහාගෙන තිබුණද එය සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරීත්වය වන “ගනුදෙනුකරුවන්ට සේවා සැලසීම” යන්න වෙනුවට එහි ප්‍රජා සම්බන්ධතා සම්බන්ධයෙන් වැඩි වශයෙන් සම්බන්ධ වී ඇති බවයි. මෙහිදී සමාගම, සන්නාමය සහ ආයතනික සංස්කෘතිය සමගාමීව පැවතීමේ වැදගත්කම අවධාරණය කරන ලද අතර සන්නාම හා ආයතනික සංස්කෘතික විශ්ලේෂණයක්ද සිදුකරන ලදී.

සමූහයේ චර්යා න්‍යාය පත්‍රය වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් දිගින් දිගටම උනන්දු වේ. මූල්‍ය අපරාධ හඳුනාගැනීම සහ වැළැක්වීම සඳහා අවශ්‍ය කාර්යක්ෂම හා තිරසාර පද්ධති හා ව්‍යුහයන් ගොඩනැංවීම සඳහා 2016 වසර තුළදී බොහෝ ආයෝජනයන් සිදුකරන ලදී. මේ සම්බන්ධයෙන් ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් සහ අනෙක් පාර්ශ්වයන් ලබාදෙන දායකත්වය විදහා දැක්වීම සඳහා බැංකුව විසින් sc.com/fightingfinancialcrime පදනම නිර්මාණය කර ඇත. හුදෙක් මූල්‍ය අපරාධ වලට එරෙහි වීමෙන් ඔබ්බට ගොස් චර්යාධර්මවලට අදාළ සියලුම අංශ සම්බන්ධයෙන් සිය අවධානය තියුණු කිරීමට බැංකුව කටයුතු කර ඇති අතර, ප්‍රමිතීන්ට සාපේක්ෂව චර්යාධර්ම ප්‍රමාණවත් නොවන බව වැටහුණු අවස්ථාවලදී ඒ සඳහා නිසි පියවර ගෙන තිබේ. නිවැරදි තීරණ ගැනීම සහ යහපත් විනිශ්චයන් ක්‍රියාවට නැංවීම සඳහා බැංකුවට උපකාර වීම පිණිස, පුද්ගලයන් ලෙස පිළිපදිනු ලබන චර්යාධර්ම, වටිනාකම් සහ මූලධර්මයන් සම්බන්ධයෙන් බැංකුව අවධානය යොමුකරයි. මෙය කළ යුතු නිවැරදි දෙය වන නිසාත්, එය සමාගම වඩාත් ශක්තිමත් හා තිරසාර සමාගමක් බවට පත්කරන නිසාත්, එමගින් පාර්ශවකරුවන්ගේ විශ්වාසය ඉහළ නංවනු ලබන නිසාත් බැංකුව මෙසේ කටයුතු කරමින් සිටී.

## තිරසාරත්වය

තිරසාරත්ව වර්ධනය සඳහා මූලික වශයෙන් දායක වන ආර්ථිකයේ ප්‍රධාන අංශවලට අවශ්‍ය මූල්‍ය සම්පාදනය කරමින් සමාජ ආර්ථික සංවර්ධනය පුළුල් කිරීම සඳහා බැංකුව සිය සේවාදායකයන් සමග අත්වැල් බැඳගෙන සිටී. ණය ප්‍රදානයේ බලපෑම් අවම කරමින් ප්‍රජාවන් වෙනුවෙන් ආයෝජනය කිරීම මෙහිදී සිදුවේ. බැංකුව සපයන මූල්‍ය දායකත්වයෙන් තිරසාර සංවර්ධනයට ලැබෙන සහය පෙන්වා දීම සඳහා 2016 වසරේදී තිරසාරත්ව ප්‍රකාශ 11 ක් සම්මත කරගන්නා ලදී. මෙම ප්‍රකාශවලට සමගාමීව, සමාගමේ මෙහෙයුම්වලින් පරිසරයට ඇතිවන බලපෑම අවම කිරීම සහ දේශීය ප්‍රජාවන්ට අත්වැලක් වීම සඳහා වැඩසටහන්ද ක්‍රියාත්මක කර තිබේ. මේ අතරින් වළක්වාගත හැකි අන්ධභාවය තුරන් කිරීම සඳහා වන ‘Seeing is Believing’ (SiB) වැඩසටහන, ක්‍රීඩා හා ජීවන කුසලතා පුහුණුව ඔස්සේ ගැහැනු දරුවන් හා තරුණයන් සවිබල ගැන්වීම ඉලක්ක කරගත් ‘Goal’ වැඩසටහන සහ තරුණ පරපුර සහ ව්‍යවසායකයන් අතර ශක්‍යතාවන් වර්ධනය කිරීම සඳහා මූල්‍ය සේවා අධ්‍යාපනය ලබාදීමේ වැඩසටහන ආදිය ප්‍රධාන තැනක් ගනී.

2008 සහ 2016 කාලය ඇතුළත බලශක්ති පරිභෝජනය 37% කින්, ජල පරිභෝජනය 35% කින් සහ කඩදාසි භාවිතය 71% කින් අවම කිරීමට බැංකුව සමත් වී ඇත. 2016 වසර තුළ ප්‍රජා වැඩසටහන් සඳහා බැංකුව ඇමරිකානු ඩොලර් මිලියන 52.3 ක් ආයෝජනය කළ අතර කාර්ය මණ්ඩලයේ සාමාජික සාමාජිකාවෝ ස්වේච්ඡා දින 67,611 කින් ඊට දායක වූහ. 2003 සහ 2016 කාලය තුළ ඇමරිකානු ඩොලර් මිලියන 92.8 ක අරමුදල් රැස් කර ඇති අතර ඒ ඔස්සේ මිලියන 133.8 ක ජනතාවකට සෙත සැලසීමට හැකිවී ඇත. 2016 වසරේදී 10 වැනි සංවත්සරය සැමරූ ‘Goal’ වැඩසටහන එම වසරේ ගැහැනු දරුවන් 69,000 කට අත්වැලක් වූ අතර, 2006 සිට මේ දක්වා එම වැඩසටහන ඔස්සේ අත්වැලක් ලැබූ ගැහැනු දරුවන් සංඛ්‍යාව 285,000 කි. මූල්‍ය සේවා අධ්‍යාපන වැඩසටහන යටතේ අපගේ කාර්ය මණ්ඩලය තරුණ තරුණයන් 106,000 දෙනෙකුට සහ ව්‍යවසායකයන් 1,020 දෙනෙකුට පුහුණුව ලබාදුන්නේ ය. මේ අතරින් 57 දෙනෙකු කාන්තාවෝ වූහ.

දේශගුණය වෙනස්වීම යන මාතෘකාව ආවරණය කරන ආස්ථානික ප්‍රකාශනයක් 2016 මාර්තු මාසයේදී ප්‍රකාශයට පත්කරන ලදී. සමූහයේ වැඩසටහන් සඳහා කුසලතා පූර්ණ කාර්ය මණ්ඩල ස්වේච්ඡා දායකත්වය හිමිවීම සමූහය විසින් පෙන්නුම් කර ඇති සුවිශේෂත්වයකි.

## සේවාදායකයන් කෙරෙහි අවධානය

ව්‍යාපාරය තුළදී ගනුදෙනුකරුවන් කෙරෙහි වැඩි අවධානයක් යොමුකරමින්, සේවාදායක කාණ්ඩ 4 ම වෙත ලැබෙන අත්දැකීම වැඩිදියුණු කිරීම සඳහා පියවර මාලාවක් ගැනීමට බැංකුව 2016 වසරේදී කටයුතු කළේ ය. උදාහරණයක් ලෙස ව්‍යාපාරික හා ආයතනික බැංකුකරණ ක්ෂේත්‍රය තුළ සේවාදායක ද්වි-ආන්තික සැපයුම් දාමය සඳහා ප්‍රමුඛත්වය ලබාදීමට බැංකුව කටයුතු කළ අතර ඩිජිටල් මෙහෙයුම් වැඩිදියුණු කරන ලදී. පාරිභෝගික බැංකුකරණය යටතේ හඬ බයෝමෙට්‍රික් තාක්ෂණය සමගින් වීඩියෝ බැංකුකරණ ක්‍රමය දියත් කරන ලද අතර ගනුදෙනුකරුවන් සඳහා නිර්මාණශීලී ගෙවීම් ක්‍රම හඳුන්වා දෙන ලදී. වාණිජ බැංකුකරණය තුළදී නව සේවාදායකයන් අන්තර්ග්‍රහණය කරගැනීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කරන ලද අතර සේවාදායකයන්ගේ ජාල සඳහා බැංකු සේවා සැපයීම කෙරෙහි අවධානය යොමුකෙරිණි. පෞද්ගලික බැංකුකරණ සහ වත්කම් කළමනාකරණ ක්‍රියාවලිය වැඩිදියුණු කරන ලද අතර ගිණුම් විවෘත කිරීමේ ක්‍රියාවලිය සරල කිරීමට පියවර ගනු ලැබීය. ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් සමාගම තාක්ෂණික නවෝත්පාදන... 

ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් සමාගම තාක්ෂණික නව්‍යකරණයන් සිදුකිරීම, ක්‍රියාවලි වේගවත් කිරීම සහ ඉක්මනින් සේවා සැලසීම ඉලක්ක කරගත් සරල, ඉක්මන් සහ වඩාත් යහපත් ආයතනයක් බවට පත්කිරීම සඳහා උත්සහ කරමින් සිටී.

2016 වසරේදී වියදම් අවම කිරීම අතින් ලැබූ සාර්ථකත්වය නිසා සමූහයේ තරඟකාරීත්ව වාසිදායක අංශ තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා සැලකිය යුතු ආයෝජනයන් සිදුකිරීමට බැංකුවට හැකියාව ලැබිණි. මෙම ආයෝජන මගින් සේවා දායකයන්ට හිමිවන සේවාවේ තත්ත්වය වැඩිදියුණු කිරීමටත්, ලාභදායී හා සුරක්ෂිත වර්ධන හැකියාවන් උදාකර ගැනීමටත්, අනෙකුත් තරඟකරුවන් අතර බැංකුව කැපීපෙනීමටත් උපකාරී වනු ඇත.

මේ වනවිට ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් බැංකුව, ක්ෂේත්‍රයට නව නිර්මාණ හඳුන්වා දෙන්නෙකු ලෙස කීර්තියක් අත්පත් කරගනිමින් සිටී. මෙම කීර්තිය ඉදිරියේදී බැංකුවට වැඩි ප්‍රතිලාභ හිමිකර දීමට හේතු වනු ඇත.

## රාජ්‍ය හා නියාමන සම්බන්ධතා

තමන් ව්‍යාපාරික මෙහෙයුම් ක්‍රියාත්මක කරන රටවල පවතින සියලුම අදාළ නීතිරීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීම සඳහා ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් බැංකුව කැපවී සිටී. මෙසේ සිය වෙළඳපොළවලට අදාළ රෙගුලාසිමය වැඩසටහන් රාමුවලට අනුකූලව වැඩ කිරීම මගින් සමාගම සිය වගකීම් ඉටුකරන බව තහවුරු වේ. එමෙන්ම එය පුළුල් මූල්‍ය පද්ධතීන් හා ආර්ථිකයන් තුළ සමූහයේ ප්‍රත්‍යස්ථික බව පවත්වාගැනීමට සහ සාර්ථක ක්‍රියාකාරීත්වය තහවුරු කිරීමට උපකාරී වේ.

සන්නාමය, වටිනාකම් සහ චර්යාධර්ම කමිටුවේ සහයෝගය සමගින් අධ්‍යක්ෂ මණ්ඩලය, සමූහයේ ප්‍රධාන පෙළේ රාජ්‍ය හා නියාමන සම්බන්ධතා සම්බන්ධ වගකීම් දරයි. මෙහිදී මෙම සම්බන්ධතාවල තත්ත්වය හා ප්‍රතිඥානය සම්බන්ධයෙන් මූලික අවධානයක් යොමුවේ. අනුකූලතා හා රාජ්‍ය කටයුතු අංශයන් දෛනිකව නෛතික හා නියාමන තත්ත්වයන්ගේ ඇතිවන වෙනස්කම් හඳුනාගෙන එම වෙනස්කම්වලට අනුකූලව කටයුතු කිරීමටත්, සම්බන්ධතා කළමනාකරණය කරගැනීමටත් සමූහයට උපකාරී වේ.

ප්‍රධාන පෙළේ ප්‍රතිපත්තිමය ගැටලු සම්බන්ධයෙන් අදහස් හා තාක්ෂණික විශේෂඥ දැනුම හුවමාරු කරගැනීම සඳහා බැංකුව ගෝලීය, කලාපීය හා ජාතික මට්ටමෙන් රජයන්, නියාමන ආයතන සහ ප්‍රතිපත්ති සම්පාදකයන් සමග සක්‍රිය ලෙස සම්බන්ධ වී කටයුතු කරයි. මෙම සම්බන්ධතා මගින් විශිෂ්ටතම පරිචයන් ස්ථාපිත කරගැනීමට හැකියාව ලැබෙන අතර සියලු වෙළඳපොළවල් සඳහා එක සමාන ප්‍රවේශයන් නිර්මාණය කිරීමට හැකියාව ලැබේ. බැංකුව අදාළ සියලුම විනිවිදතා අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කරන අතර සිය දේශපාලන ක්‍රියාකාරීත්වයන් සම්බන්ධ තොරතුරු අනාවරණය කිරීමට පියවර ගනියි.

අඛණ්ඩව සිදුකරනු ලබන සංවාද, නිල වශයෙන් අදහස් විමසීම්වලදී ප්‍රතිචාර ලබාදීම සහ ක්ෂේත්‍රයේ කාර්යසාධන කණ්ඩායම් හා සම්බන්ධ වී සහභාගීත්වය ලබාදීම ආදිය ඔස්සේ ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ්, රජයන් හා නියාමන ආයතන සමග සම්බන්ධ වේ. උදාහරණයක් ලෙස 2016 වසරේදී බැංකුව ජාත්‍යන්තර ප්‍රමිති සම්පාදකයන් විසින් අදාළ නියාමන වැඩරාමුවට සිදුකිරීමට යෝජනා කර ඇති වෙනස්කම් සම්බන්ධයෙන් සිය ලිඛිත හා වාචික ප්‍රතිචාරයන් ලබාදීමට කටයුතු කළේ ය.

**සමූහයේ වාර්ෂික වාර්තාවෙහි සංක්ෂිප්ත උපුටනයක් ඉහත දක්වා ඇත. www.scb.com වෙබ් අඩවියෙන් සම්පූර්ණ වාර්තාව ලබාගත හැක.**